Before the night passes away
Light the Lamp of my life
With ur flame, O Beloved
I am waiting for the evening
When u will come along path carrying ur flame
And my heart with it's broading darkness
Will light up in a blaze.

**-Rabindranath Tagore-**

## අභිනිෂ්ක්‍රමණය

ජීවිතේ
අවුල් ගිය
මකුළු දැලක
මගෙ හදවත
මැස්සෙකු සේ
පැටලේවිද??

තිත්ත කළුවර රැයක කණාමැදිරියෙකු සේ
දිලිසිලා මොහොතකට නිවී යන්නට කලින්
දුම් බැඳුණු දැලි බැඳුණු යෞවනේ සඳවතින්
හදවතේ රුවා ගන්නට යමක් යදින්නෙමි

අන්ධකාරයේ මායා දැලින් විමුක්තව
ඉපිද එන සුවාසක් හැඟුම් විනිවිඳින්නෙමි
සිතම නිර්වස්ත්‍ර කොට පටාචාරව සේ
රාගයේ උකුස්සන් සමඟ පොරබදින්නෙමි

ඈත ආකාශයෙන් හමා එන සුළං රැළි
රැළි නැගී සුළි ගැසී හදවතේ නතර වෙයි
සඳක් මෙන් පැහැපත්ව මලක් මෙන් සුවිපුල්ව
අනාගතයක නැවුම් රුවක් ඒ තුළ පෙනෙයි

ජීවිතේ ස්වර තන්තු එකින් එක කම්පිතව
හංස ගීතයක පද පෙළක් මතු කරයි
හදවතට කටු අනින ඒ පුංචි ගීතයට
නව පණක් එන්න ඔබෙ සිහින් කටහඬ දෙන්න

**රසික ජයකොඩි** - ශ්‍රී ලංකාව

## අප

සඳ පහන සේ දිලී හිනැහියන්
මහ වැස්ස ඇද හැලී ගිය සැණින්
කොවුල් නද වී ගීත ගයාපන්
සැඩ සුළඟ නිසල වී ගිය සැණින්

සඳ හිරු තරු කැට
නොපෙනෙන වන ගැබ
සිටියාට නොදැණුනා පාළුවක්
ඔබත් මා ළං ව ඇති
කටුක වූ මනු පුරේ
සොයමි හුරු පුරුදු වූ මාවතක්

ඇළ දොළ පාමුල ගැයෙනා කවියකි
අප හද මල් තුළ රැඳෙනා සෙනෙහස
කුණාටු සුළඟට මොර ගෙඩි වැස්සට
දිය කල හැකි වෙද හද රැඳි ඵ සුවඳ

**රංග වීරක්කොඩි**

## පුංචි වුණාත් ලොකු වීරයෙක්...



පුංචි ක්‍රිකට් තරඟයක්
මහා ලොකු වීරයෙක්
ලෙදර් බෝලෙන් සටන්
අබිබවා අනිත් උන්
ඔබ වීකුම් පෙන්නුවා
නමුත් දිනුවේ මමයි

ක්‍රිකට් පිත්තෙන් සටන්
බැරි වුණා අද දිනේ
පුංචි කඳුළක් සිහින්
ඉපදුණා මගෙ නෙතෙත්
දිනුම පැරදුම සම සිතින්
පුරුදු වෙමු ඉවසන්න මගෙ පුතේ
නුඹ ළඟයි හැමදාම මම සිතින්
දැවී යන්නට එපා ජීවිතෙන්....

**දේවිකා ඉලංකෝන්**
රිවර්හිල්ස්

## සුභාෂිතයෙන්

විපුල නැනැති මහතුන් හට පත් විපත
නිසල නැනින් යුතු උතුමෝ දුර ලත
කලල ගිලුනු මත වරනිඳු ගොඩ ගනුත
තුමුල බලැති ගිජිඳකු මිස අන් කෙවත

### පදාවලිය

විපුල නැනැති
මහතුන් හට
පත් විපත
නිසල නැනින් යුතු
උතුමෝම
දුරලති

තේරුම
බොහෝ නැනවත්
මහතුන්ට
විපතක් වූ විට
තැන්පත් - දුර දක්නා
නුවනින් යුතු
උතුමෝ - ඔවුන්ට පිහිට වෙති;
ඒ විපත දුරු කරති
කලල ගිලුනු
මත වරනිඳු
ගොඩගනුත (ගිනතොත්)
තුමුල බලැති
ගිජිඳකු මිස
අන් කෙවත?

එය හරියට මඩේ එරුණු මදැතකු ගොඩගැනීම කළ හැක්කේ මහා බල - මහා වීරිය ඇති ඇත් රජකුට මිස අන් එකකුට නො වීම වැනිය.

මහතුන්, උතුමෝ බහුවචනයෙන් තබා වරනිඳු, ගිජිඳකු ඒක වචනයෙන් තැබීම නොගැලපේ. මහතකු, උතුමෙක් යනුවෙන් එය යෙදුනා නම් හොඳින් ගැලපේ. එසේත් නැත්නම් මත වරනිඳුත්, ගිජිඳුන් යනුවෙන් විය යුතුය. වලේ ගැඹුර අනුව තුමුල බලැති ගිජිඳකු උවද එයට අසමත් විය හැකිය. අද නම් කෙරෙහෙනක් (දොඹකරයක්) ඒ සඳහා යොදා ගැනේ. තුමුල - මහත් (මේ වචන ගැන එහි සුලමුල ගැන මීට වැඩි යමක් කීමට නොදන-මි.) දුරලති යන්න -දුරලත" වී ඇත්තේ එපිවැට රැකීමටය. වරනූඉඳු, වරනිඳු, ගජ්ඉඳු ගජිඳු, ( ඉඳුරජ, කෙ/කො , කවර, කෙතරම්/කොතරම්, කෙබඳු, කෙතෙක්/කොතෙක්, කොහි, කොදා, කොපමණ, කෙලෙස යන තැන්වල ඇති කෙ/කො යන්නේ අරුත -කවර" යනුයේ. එතරම්-මෙතරම්-කොතරම්, එබඳු-මෙබඳු-කෙබඳු, එහි-මෙහි-කොහි ආදී වශයෙන් ඇති වහර ඉගෙන ගන්න. කොහාට, කොහෙන්, කොහේ, කොයින් ද? යන වහර ගැන ද සිතා බලන්න.

**වි. ක. ධර්මබන්ධු**

---

*සින්දුව සහ නිසඳැස් කවිය*

ප්‍රේම ගඟේ
මැනික් වගේ
අප දෙන්නා හිතේ තිබී
ආදරේ
එලි උනේ අදයි
ප්‍රේමාදරේ
විලේ නෙලුම්
පුබුදු කුසුම්
වන බමරුන්
රොන් අර ගන්නේ
වන බමරුන්
රොන් අර ගන්නේ....
....................
මෙය සුජාතා චිත්‍රපටියේ ගීතයක කොටසකි. මෙය ගයන තාලය නොදන්නා- මෙය ගීතයක් බව නොදන්නා කෙනාට මෙය පෙනෙන්නේ - නිසඳැස් කවියක්" විදියට යැයි සිතමි. එහෙයි-න් ඔහු තමා කැමති විදියට එය කියවනු ඇත



## Ruwani's 3rd solo exhibition of oil paintings



Ruwani Perera presented her 3rd solo exhibition of oil paintings at Lionel Wendt Art Centre, Colombo in November 2007. The exhibition was declared open by the renowned naturalist and biodiversity expert Rohan Pethiyagoda.

Working in a realistic style in oils, she paints a variety of subjects. But wildlife and nature remains her first love. Ruwani's work represents her interpretation of nature, through observation in every day life, in her travels that she explores visually.



Apart from painting she has been involved in arts and crafts for a long time. Ruwani has developed a novel three dimensional art of her own which she reproduces the temple paintings. Background is done using oil colours and the foreground figures and objects are done using cloth that painted with fabric colours.

For the very first time, she made the opportunity to present this novel collection of 3D temple paintings to the Sri Lankan art lovers at her exhibition.

Art lovers can explore her work by visiting http:// www.ruwaniperera.com


**GATEWAY LAWYERS**

- Advice on Legal Matters
- Business & Commercial
- Conveyancing - Sale or Purchase of Houses, Vacant Land, Units, Flats, Shops, Factories & Farms
- General, Medical or Enduring Powers of Attorney
- Wills & Estate Planning

*Professional, Quality Service Assured*

Senanie Kurukularatne LL.B, Grad Dip.LP
Barrister & Solicitor
Attorney -at- Law - Sri Lanka

Phone : 03 87869682
Fax : 03 87869681
Mobile : 0414 660 513
Email : gateway5@bigpond.net.au
17, Glenview Rise, Berwick, VIC 3806 Austraila